**පොකුණට** කුඩා මත්සයන් යෙදීම අත්‍යාවශ්‍ය වේ. නැතහොත් මදුරුවන් බිත්තර දමා ඩෙංගු , මැලේරියා, බරවා වැනි ලෙඩ පැතිරී යා හැකිය. සුරතල් මසුන් ඇති කිරීමට අකමැති අයකු වෙතොත් ඔබේ පොකුණෙහි ඇති ජලයෙහි ලවණතාවය වැඩි කරන්න. ඒ සඳහා ඔබට පොකුණෙහි ඇති ජලයට ලුණු එකතු කළහැකි වේ. මුහුදු ජලයෙහි හෝ ලුණු සහිත ජලයෙහි කිසිදු විටක මදුරුවන් බිත්තර දැමීමක් සිදු නොවේ.
එසේත් නොමැති නම් ඔබේ දිය ඇල්ල හා පොකුණ සහිත නිර්මාණය ස්වභාවික දොල පාරක් ආකාරයට තරමක් දික්ව සකස් කරන්න. එහි එක් කෙලවරක දිය ඇල්ල හා අනෙක් කෙලවර මෝටරය සවි කරන්න. එවිට නිතරම ජලය ගලා යන ස්වභාවයක් දැකිය හැකි වේ. ගලාගෙන යන ජලයෙහි මදුරුවන් බිත්තර නොදමයි. මෙම ක්‍රමය නිවසක් ආශ්‍රිතව ප්‍රායෝගික නොවන්නේ ඔබ නිදාගත් අවස්ථාවේදි ද මෝටරය ක්‍රියාත්මක වන බැවිනි.

**දිය ඇල්ලක් හා පොකුණක්** සකස් කිරීමේදි ස්වාභාවික ගල් (වැලි ගල් හෝ දොල ගල්) යොදාගත් නිර්මාණයක් නම් එහි උස කොපමනද යන්න තීරණය කළයුතු වේ. දියඇල්ලේ උසට සාපේක්ෂව එම උසෙන් තුනෙන් දෙකක පළලක් පොකුණ සඳහා වෙන් කළයුතු වේ.



නැතහොත් දිය ඇල්ලෙන් ගලාඑන ජලය පොකුණෙන් පිටතටද විසි වී යනු දැකිය හැකි වේ. ඔබ ගල් පතුරු හෙවත් පොයින්ට් ගල් යොදා ගනිමින් , ජලතීරයක් සකස් කරන්නේ නම් එහිදි පොකුණෙහි පළල අගල් හයක් වුව ප්‍රමාණවත් වේ.

අපි පළමුව වැලිගල් හෙවත් කුඩුගල් හෝ දොලගල් හෙවත් බෝලගල් යොදාගනිමින් ස්වාභාවික දියඇල්ලක් සකස් කර ගැනීමේ දී කළයුතු ක්‍රියාමාර්ග වෙත අවධානය යොමු කරමු.

දිය ඇල්ල සකස් කිරිම සඳහා ඔබ තීරණය කළ උස තුනෙන් බෙදන්න. නිදසුනක් ලෙස ඔබ අඩි 6 උස දිය ඇල්ලක් සකස් කිරීමට තීරණය කලේනම් අඩි 2 කොටස් 3 ලෙස බෙදා දැක්විය හැකිය. අනතුරුව ඔබ අඩි දෙකේ උස කොටස් තුනක් පිහිටන ලෙස ආකෘතියක් සකස් කර ගත යුතුය. මෙහිදී පහළම අඩිය අඩි 3 × 3 ප්‍රමාණයට හා දෙවන පඩිය අඩි 2 × 2 ප්‍රමාණයට අඩි දෙකක් උසටත් තෙවන පඩිය අඩි 1 × 1 ප්‍රමාණයට අඩි දෙකක් උසටත් සකස් කර ගන්න.

අනතුරුව පොකුණ අගල් 18 හෙවත් අඩි හත හමාරක් ගැඹුරට හාරාගෙන එහි යටට ඝණකම පොලිතින් කැබැල්ලක් යොදා ඒ මතුපිට කුකුළු දැල් එලා ගනිමින් සිමෙන්ති 1, වැලි 2, චිප්ගල් 3, ප්‍රතිශතයට කොන්ක්‍රිට් මිශ්‍රණය සකස් කරගෙන පොකුණ කොන්ක්‍රිට් කර ගන්න. අනතුරුව දිය ඇල්ලේ ආධාරකය හා පොකුණ වැලි තුනකට සිමෙන්ති 1 ක් යොදා සකස් කරගත් බදාමයකින් කපරාරු කර ගන්න. ඉන්පසු ඔබ සකස් කරගත් ආධාරකය මත වැලිගල් හෝ දොලගල් යොදා ගනිමින් දිය ඇල්ල ඉදිකරගත හැකි වනු ඇත.

අනතුරුව පොකුණ අවට පරිසරය සඳහා ජලය ප්‍රිය ශාක යොදා ගනිමින් එහි අලංකාරය වැඩි කරගත හැකිය.

සටහන:-
උද්‍යාන විද්‍යා උපදේශක
ප්‍රවීන උද්‍යාන
සැලසුම් ශිල්පී,
**උපුල් අමරසිංහ**



දිනපතා උදෑසන 6.05 ට
දෙස් විදෙස් දැනුම් ඥාන කෝෂය
පුවත් සැරිසර
ජාතික නාලිකාවෙන්

